**යාපනය කිළිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - ඉරණමඩු කොටස - 2019**

---

යාපනය කිළිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ඉරණමඩු කොටසේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 පෙබරවාරි 08 දින එළඹි අංක 2711 දරන ණය ගිවිසුම්වල II B ව්‍යවස්ථාවේ 2 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම ප්‍රකාරව, අභ්‍යන්තර කටයුතු සහ පළාත් සභා සහ පළාත් පාලන ආතනය විසින් මෙම මෙම ව්‍යාපෘතිය නියාමනය කරන අතර, උතුරු පළාත් සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ. ඉරණමඩු ජලාශයේ ජලය රඳවාගැනීමේ ධාරිතාවය සහ ශක්තිමත්භාවය වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩොලර් 16.91 ක් හෙවත් රු. මිලියන 2,198.30කට සමාන වන අතර, ඉන් ඇ.ඩොලර් 13.49ක් හෙවත් රු. මිලියන 1, 753.70ක් මූල්‍ය ප්‍රතිපාදන ආසියානු සංවර්ධන බැංකුව මඟින් ලබාදීමට එකඟ වී ඇත. ඉතිරි ප්‍රතිපාදනයන් ශ්‍රී ලංකා රජය මඟින් ලබාදීමට බලාපොරොත්තු වේ. 2011 මාර්තු මස 06 වන දින ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරන ලද අතර, 2017 අගෝස්තු 14 දින වන විට අවසන් කිරීම සඳහා සැලසුම් සකස් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘති කාලය 2020 දෙසැම්බර් මස 31 දින දක්වා දීර්ඝ කර ඇත.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එහි වියදම් සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යටතේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම, ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය විසින් එහි  වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර,  ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණනයේදී හඳුනාගත් අඩුපාඩුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| වෙන් කල මුදලින් රු. 32,362,896 ක ප්‍රමාද ගාස්තු සහ රු. 212,681 ක මූල්‍ය ගාස්තු කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු වුවද ආරවුල් විනිශ්චය මණ්ඩලයේ තීරණයන්ට අනුව එය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය පුකාශන වලට ගෙන නොතිබුණි. | වගකීම් අඩුවෙන් දැක්වීම | ලැබිය යුතු ප්‍රතිපාදන පිළිබඳව ආරවුල් විනිශ්චය මණ්ඩලය ලබා දුන් තීරණය මත පදනම්ව උතුරු පළාත් ප්‍රධාන ලේකම් විසින් පළාත් සභා අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් සිදු කර ඇත. | මූල්‍ය ප්‍රකාශන වල සියලුම අදාල තොරතුරු එහි පාර්ශවකරුවන් වෙත හෙලිදරව් කල යුතුය. |

**3.1 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණනයේදී හඳුනාගත් අඩුපාඩුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ වගකීම් කාලය 2019 දෙසැම්බර් 31 දිනට අවසන් වී තිබුණද කොන්ත්‍රාත් සේවා ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසි අනුව කාර්ය පැවරුම් සම්පූර්ණ කිරීමේ වාර්තාව කොන්ත්‍රාත්කරුට කාර්යසාධන සහතිකය නිකුත් කොට සති දෙකක් ඇතුළත ඉදිරිපත් කල යුතු වුවද උපදේශක විසින් එසේ සිදු කර නොතිබුණි.. එහි ප්‍රතිඵලයක් වශයෙන් උපදේශක සේවා සඳහා වන අවසාන ගෙවීම වූ රු. 1,493,092 ක් උපදේශකවරයාට ගෙවා නොතිබූ අතර එය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | කොන්ත්‍රාත්කරුට ගෙවීම ප්‍රමාද වීම | මේ වන විට උපදේශන විසින් පැවරුම් සම්පූර්ණ කිරීමේ වාර්තාව ඉදිරිපත් කර ඇති අතර අප එය පරීක්ෂා කරමින් සිටිමු. ඉන්පසු උපදේශක සඳහා ගෙවීම නිදහස් කරනු ලැබේ. | උපදේශක සමඟ ඇතිකරගත් සේවා ගිවිසුමට අනුව ව්‍යාපෘති නිම කිරීමේ වාර්තාව ලේඛනගත කළ යුතුය. කොන්ත්‍රාත්කරු විසින් සිදු කරනු ලබන සත්‍ය නිම කිරීම් විධිමත් හා අඩුපාඩු රහිතව සිදු කල බවට අවසාන සාක්ෂිය උපදේශකයාගේ අවසන් නිම කිරීමේ වාර්තාව වේ. |

## 3.2 භාවිතයට නොගත් සම්පත්

| විගණනයේදී හඳුනාගත් අඩුපාඩුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| පිරිවැය රු.මිලියන 21.96 ක් වූ කොන්ක්‍රීට් ස්ලැබ් 05 ක් සහිත ගොඩනැගිල්ලක් සූර්ය බලශක්ති යෙන් විදුලිය උත්පාදනය සඳහා ස්ථාපිත කර තිබුණි. කෙසේ වෙතත් එම ගොඩනැගිල්ල වසර දෙකකට වඩා වැඩි කාලයක් තුළඅක්‍රියව පැවතුනි. | ඉදිකරන ලද ගොඩනැගිල්ලේ භාවිතා නොකරන ලද ධාරිතාවය | මුල් කොන්ත්‍රාත්තුවේ ගොඩනැගිලි සඳහා ප්‍රතිපාදන නොමැති අතර සූර්ය පැනල භූමියේ බිම් මට්ටමට මදක් ඉහලින් සවි කිරීමට සැලසුම් කර ඇත.<br><br>ගොවීන් සඳහා ගබඩා ගොඩනැගිලි අවශ්‍ය වේ. ගොවීන්ගේ ප්‍රතිලාභ සහ ව්‍යාපෘතියේ තිරසාර බව සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ අවශ්‍යතාවයන්ට අනුව **"Net Plus"** විදුලිබල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා සූර්ය බලශක්ති පද්ධතියක් වහලයේ සවි කිරීමට මෙම ගොඩනැගිලි ඉදිකර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ අරමුදල් අඩුවෙන් ලබා දීම හේතුවෙන් සම්පූර්ණ ගොඩනැගිල්ලම ක්‍රියාකාරී ලෙස නිම කිරීමට නොහැකි වූ අතර වහලය දක්වා නිමකර සූර්ය පැනලය සවිකර විදුලිබල නිෂ්පාදනය ආරම්භ කරන ලදී. නමුත් අප **ASMP** ව්‍යාපෘතිය සමග සාකච්ඡා කොට මෙම ගොඩනැගිල්ල සම්පූර්ණ කොට ගොවීන්ට නිෂ්පාදන ගබඩා කිරීම සඳහා පහසුකම් සලස්වන ලදී.<br>.<br><br>**COVID – 19** හේතුවෙන් කිලිනොච්චි දිසිත්‍රික්කයේ **ASMP** ව්‍යාපෘතිය අනුමත කිරීමේ යම් ප්‍රමාදයක් පවතී. | ගොඩනැගිල්ල අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමට පියවර ගත යුතුය. |

**3.3 පද්ධති හා පාලන**

| විගණනයේදී හඳුනාගත් අඩුපාඩුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| ගොවි ලේඛණයක් නඩත්තු කිරීමක් සිදු නොකර සෝපාන වාරිමාර්ග හරහා ජලය බෙදා හැරීම සිදු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ගේ සමස්ථ ජනගහනය නිසි පරිදි හඳුනා ගැනීමට නොහැකි විය. | ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් හඳුනා ගැනීමට නොහැකි වීම | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහාය ඇතිව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හරහා හෙල්මළු කුමයට වගා කරන ගොවීන්ගේ ලේඛණයක් සකස් කර පවත්වාගෙන යාමට අප විසින් පියවර ගෙන ඇති අතර කුඹුරු ඉඩම් ලේඛණය යාවත්කාලීන කිරීම සිදු කරමින් පවතී. එය අවසන් වූ පසු ඉහල ඉඩම් ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ කරනු ඇත. මේ වන විට එය ක්‍රියාත්මක වන්නේ ගොවීන්ගේ සංවිධානය සමග ඇති ලැයිස්තුව සමගය. | ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් හඳුනා ගැනීම සඳහා ලේඛණය නඩත්තු කල යුතුය. |